සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

විෂය - ගිණුම්කරණය

සතිය - 7

ශ්‍රේණිය - 12

සකස් කළේ - කලාප අධ්‍යාපන කාර්යාලය,රත්නපුර.

කාලය මිනිත්තු 20 යි.

නිපුණතාව 9.0 - ආයතනයක ගිණුම් වාර්තා අසම්පූර්ණ වූ විටත් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි.

නිපුණතා මට්ටම 9.1 - අසම්පූර්ණ සටහන් පැහැදිලි කර එයට හේතු ඉදිරිපත් කරයි.

<u>**අභ්‍යාස 01**</u>

අජිත්ගේ ව්‍යාපාරයේ පහත තොරතුරු ඔබට සපයා ඇත.

- වත්කම් හා වගකීම් ලේඛනය පහත දැක්වේ.

| අයිතම | රු.<br>2018/04/01 | රු.<br>2019/03/31 |
|---|---|---|
| යන්ත්‍ර උපකරණ | 120 000 | 180 000 |
| ලී බඩු සවි කිරීම | 80 000 | 60 000 |
| තොගය | 30 000 | 40 000 |
| ණය ගැතියෝ | 45 000 | 53 000 |
| මුදල් | 15 000 | ? |
| උපචිත මෙහෙයුම් වියදම් | 3 000 | 4 000 |
| ණය හිමියෝ | 27 000 | 18 000 |

අමතර තොරතුරු

- වර්ෂය තුළ රු. 80 000 ක යන්ත්‍රයක් ලබාගත් අතර රු. 10 000 ක ලී බඩු උපකරණ වර්ෂය තුළ රු. 12 000 කට විකුණා ඇත.
- මුදලින් ගෙවූ මෙහෙයුම් වියදම් රු. 17 000 කි.
- වර්ෂය තුළ රු. 50 000 ක බැංකු ණයක් ලබාගෙන රු. 55 000 ක් ගෙවා, එම ණය වර්ෂය තුළ නිදහස් කර ඇත.
- අයිතිකරු විසින් රු. 6000 ක් ලබාගෙන ඇති අතර රු. 15 000 ක අමතර මුදලක් ව්‍යාපාරයට යොදවා ඇත.
- ගිණුම් කාලච්ඡේදය තුළ ගනුදෙනුකරුවනගෙන් රු. 240 000 ක් ලැබී ඇති අතර දුන් වට්ටම් රු. 4000 ක් දී ඇත. කාලච්ඡේදය තුළදී ණය හිමියන්ට මුදල් ගෙවීමේදී රු. 5000 ක වට්ටමක් ලැබුණි.

- පිරිවැයට $33\frac{1}{3}$ % ක් ලාභ තබාගෙන භාණ්ඩ විකුණා ඇත.

අවශ්‍ය වන්නේ,

- ✓ 2019.03.31 දිනෙන් අවසන් වර්ෂයේ ලාභ හෝ අලාභ ප්‍රකාශනය සහ එදිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය